FACT SHEET

මැයි, 2026

# ශ්‍රී ලංකාවේ සිගරට් බදුකරණයේ නවතම ප්‍රවණතා සහ එහි බලපෑම

**2023 වසරේ සිගරට් බදු 20% කින් වැඩි කිරීම හේතුවෙන්:**

- සිගරට් අලෙවිය මිලියන 521.5 කින් අඩු විය. එය 2022 වසරට සාපේක්ෂව 18% ක අඩුවීමක් වේ.
- රජයේ සිගරට් බදු ආදායම රුපියල් බිලියන 7.7 කින් වැඩි විය.

සිගරට් බදු සහ මිල වැඩි කිරීම යනු ඒවායේ භාවිතය සහ එමගින් වන හානිය  අඩු කිරීම සඳහා ලොව පුරා පිළිගත්, සාක්ෂි මත පදනම් වූ ක්‍රමවේදයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් නිර්දේශ කර ඇති මෙම ප්‍රවේශය මගින් සිගරට් මිලදී ගැනීමේ හැකියාව අඩු කිරීම හරහා භාවිතය පහළ දමන අතර, එමගින් රටේ සෞඛ්‍ය වියදම අඩු කරමින් රජයට ලැබෙන සිගරට් බදු ආදායම වැඩි කිරීමට ද දායක වේ.

**එහෙත්,**

- 2024/25 කාලය තුළ බොහෝ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්හි මිල සහ බදු වැඩිවූ නමුත්, 2025 වර්ෂයේ සිගරට් බදු වැඩි වීමේ මන්දගාමී බව නිසා  පසුගිය වසර ගණනාවක් පුරා පැවත ආ සිගරට් නිෂ්පාදනය පහළ යාමේ ප්‍රවණතාවයට අභියෝග කරමින් 2025 වසර තුළ සිගරට් නිෂ්පාදනයේ 5% ක වැඩිවීමක් සිදුව ඇත.
- උද්ධමනය සහ ආදායම් වර්ධනයට අනුව බදු සහ මිල සංශෝධන සිදු නොකිරීම නිසා  සිගරට් මිලදී ගැනීමේ හැකියාව වැඩි වී ඇති අතර එය සෘජුවම සිගරට් නිෂ්පාදනය සහ භාවිතය ඉහළ යාමට දායක වී ඇත. මෙය සිගරට් බදු ප්‍රතිපත්තීන්හි දුර්වලතා මනාව විද්‍යමාන කරයි.
- සිගරට් කර්මාන්තයට වාසිදායක, විද්‍යාත්මක නොවන බදු ව්‍යුහයක් අඛණ්ඩව භාවිතා කිරීම හේතුවෙන් දුම්කොළ පාලනයට දරන උත්සාහයන්ගේ කාර්යක්ෂමතාවය තවදුරටත් දුර්වල වී ඇති අතර, දුම්කොළ කර්මාන්තයට අතිවිශාල ලාභ උපයා ගැනීමට අවකාශය ලබා දී ඇත. 2017 - 2024 කාලපරිච්ඡේදය තුළ රජයේ සිගරට් බදු ආදායමෙහි වර්ධනය 27.5%ක් වැනි මට්ටමක පැවතියද, ලංකා දුම්කොළ සමාගමේ ශුද්ධ ලාභය 92.4% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වයි. මෙම සංඛ්‍යාලේඛන මගින් වත්මන් බදු ප්‍රතිපත්තියේ ඇති බරපතල ගැටලුකාරී ස්වභාවය මනාව පැහැදිලි වේ.

## සිගරට් බදු ප්‍රවණතා


ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් සිගරට් සිල්ලර මිලෙන් 75%ක් බදු වශයෙන් පැවතිය යුතු බවට කරන නිර්දේශය, ශ්‍රී ලංකාව තුළද පසුගිය වසර කිහිපය පුරාම අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, 2024 වසරේදී වෙළෙඳපොළේ වැඩිම අලෙවියක් ඇති සිගරට් කාණ්ඩයේ බදු ප්‍රතිශතය 74.0% සිට 68.8% දක්වා පහත වැටී ඇත. 2025 වර්ෂයේදී ද එම තත්වය නිවැරදි නොවීම කණගාටුවට කරුණකි.

මෙම තත්ත්වය දුම්කොළ බදුකරණයේ සමස්ත ඵලදායීතාවය අඩපණ කරන අතර දුම්කොළ කර්මාන්තයට ඉහළ ප්‍රතිලාභ ලබා දීමට හේතු වේ.

2023 වසරට සාපේක්ෂව 2024 වසරේ සිගරට් වෙළඳපොළ තුළ සිගරට් විවිධ බදු කාණ්ඩවලට අදාල සිගරට් අලෙවියේ සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය වේ. නිවැරදි බදු ක්‍රමවේදයක් නොමැති අවස්ථාවෙන් දුම්කොළ සමාගම ඉතාමත් වාසි සහගත තත්වයක් උදාකරගනිමින් ඔවුන්ගේ ලාභ අති දැවැන්ත ලෙස වර්ධනය කරගැනීමක් සිදු කරගෙන ඇත. මෙම තත්වය නිසා Verité Research ආයතනය පවසන පරිදි 2024 දී රජයට අහිමි වූ බදු මුදල රුපියල් බිලියන 9.4 කි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (WHO FCTC), සියලුම සිගරට් වර්ග සඳහා 'ඒකාකාරී බදු ක්‍රමයක්' ක්‍රියාත්මක කිරීමට යෝජනා කරයි. එමගින් සිගරට්වල මිලදී ගැනීමේ හැකියාව අඩු කෙරෙන අතර, සමස්ත දුම්කොළ භාවිතය අඩු කිරීමටත්, පාරිභෝගිකයන් අඩු මිල විකල්ප වෙත යොමු වීම වැළැක්වීමටත් බොහෝ සාර්ථක ප්‍රවේශයක් බව එම සම්මුතිය පෙන්වා දෙයි

### 2000 සිට 2025 දක්වා ලංකා දුම්කොළ සමාගමේ ලාභය සහ සිගරට් නිෂ්පාදනය




2000 සිට 2025 දක්වා සමස්ත සිගරට් නිෂ්පාදනයේ  සමස්ත පහත වැටීමේ ප්‍රවණතාවයක් තිබියදීත්, ලංකා දුම්කොළ සමාගමේ ලාභ අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර, එය ශ්‍රී ලංකාවේ දුම්කොළ බදු ප්‍රතිපත්තියේ විශාල  පරතරයක් ඉස්මතු කරයි.

## ප්‍රධාන නිර්දේශ:

- උද්ධමනයට සහ ආදායම් වර්ධනයට අනුකූලව දුම්කොළ බදු ඉහළ නැංවීම.
- ඒකාකාරී දුම්කොළ බදු ව්‍යුහයක් හඳුන්වා දීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත සඳහා යෝජිත සංශෝධන බලාත්මක කිරීම. (ඒකල වශයෙන් සිගරට් විකිණීම තහනම් කිරීම, වෙළඳ ලකුණු රහිත සිගරට් පැකට් හඳුන්වා දීම.)
- 'දුම්කොළ වලින් නිදහස් පරපුරක්' යන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- දුම්කොළ පාලන ක්‍රියාවලිය තුළ "හානිය අවම කිරීමේ" ව්‍යාජ මතවාද ප්‍රතික්ෂේප කිරීම.
- දුම්කොළ කර්මාන්තයේ අනිසි මැදිහත්වීම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ ප්‍රජා ක්‍රියාකාරකම් දිරිගැන්වීම.

**Sources:**

The Case for Investing in WHO FCTC Implementation in Sri Lanka, Central Bank of Sri Lanka, Sri Lanka Customs, Verité Research


Alcohol and Drug Information Centre
40/18, Park Road, Colombo 5.
+94 112 584416, +94 112 592515
www.adicsrilanka.org


ADIC
Alcohol and Drug Information Centre